ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී (ගෞරව) උපාධි පාඨමාලාව - 3 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II – 2023/2024

**LLU 3303 - රෝම නීතිය**

කාලය : පැය එකයි (01)

දිනය : 2025 ජනවාරි 06 වේලාව : පෙ.ව. 9.30 - පෙ.ව. 10.30

මුළු ප්‍රශ්න ගණන : දෙකයි (02)

එක් (01) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. ඔගස්ටා සමඟ විවාහ වී සිටින ලූකස් 20 හැවිරිදි ටුලියෝ සහ 16 හැවිරිදි බෙලෝනාගේ පීතෘ මූලිකයා වේ. බුන්වත්භාවය හේතුවෙන් තමාගේ පවුල නඩත්තු කිරීමට ලූකස්ට නොහැකි විය. එසේ හෙයින්, 65 වියැති ධනවත් රෝම පුරවැසියෙකු වූ ඔක්ටේවියස් විසින් ලූකස් ව පුත්‍රෝත්පත්තියට පත් කර ගන්නා ලදී. ඔක්ටේවියස් කෙරෙහි ඇති අප්‍රසාදයෙන් පසු වූ ටුලියෝ පවුලෙන් වෙන් වී 30 වියැති ප්‍රිස්කා සමඟ එක්ව වාසය කිරීමට පටන් ගත්තේය. ප්‍රිස්කා ඒ වන විටත් ඩෙසිමස් සමඟ විවාහ වී සිටි බව නොදැන සිටි ටුලියෝ වලංගු *usus* විවාහයක් ස්ථාපනය කිරීමට අපේක්ෂා කරයි.

   ඔක්ටේවියස් තම මිතුරකුගේ වැඩිමහල් පුත්‍රයා වූ නීරෝ සමඟ බෙලෝනාගේ විවාහය සූදානම් කළේය. නීරෝ මානසික රෝගයකින් පෙළෙන බව දැනගත් ලූකස් සහ බෙලෝනා යන දෙදෙනාම මෙම විවාහයට විරුද්ධ වූහ. කෙසේ වෙතත්, ලූකස් හා බෙලෝනාගේ විරුද්ධත්වය නොතකා එම විවාහය සිදු විය. මාස කිහිපයකට පසුව, ඔහුගේ මානසික රෝගය හේතුවෙන් නීරෝ බෙලෝනාට පහර දී වධහිංසා කළේය. තමාගේ පීතෘ මූලිකයා වෙත ආපසු පැමිණි බෙලෝනා නීරෝගෙන් දික්කසාද වීම සඳහා ඉල්ලා සිටියාය.

   මේ අතර බෙලෝනා අනාචාරී ස්ත්‍රියක් බවට චෝදනා කරමින් නීරෝගේ පියා පවසා සිටියේ දික්කසාදයෙන් පසුව *dos profectitia* දායාදය නීරෝ වෙත තබා ගත යුතු බවයි.

   රෝමානු නීතිය යටතේ අදාළ නෛතික මූලධර්ම විස්තර කරමින් ඉහත සිද්ධීන් තුළින් මතු වන නෛතික ප්‍රස්තුතයන් සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

2. ජස්ටිනියන් අධිරාජ්‍යයාගේ සමයේ විසූ ධනවත් රෝම පුරවැසියෙකු වන කැෂියස්ට, අන්තිම කැමති පත්‍රයක් යටතේ සිය දේපළ බැහැර කිරීමට අවශ්‍යව ඇත. ඔහු සිය 14 හැවිරිදි සහ 16 හැවිරිදි වැඩිමහල් පුත්‍රයන් දෙදෙනා සහ ඔහුගේ දස හැවිරිදි බාල පුත්‍රයාද උරුමකරුවන් ලෙස පත් කිරීමට අදහස් කරයි. කෙසේ නමුත්, ඔහුගේ බාල පුත්‍රයා වන 10 හැවිරිදි ටුල්ලියුස් බාලවයස්කරුවෙකු බැවින් ඔහු උරුමකරුවෙකු ලෙස පත් කිරීම පිළිබඳව කැෂියස් පැකිළෙයි. තවද, විවාහ දිනයේදී ප්‍රමාණවත් දායාදයක් තම දියණිය වන ග්‍රේෂියානා හට ලබා දී ඇති බැවින් ඇය තමාගේ අන්තිම කැමති පත්‍රයේ උරුමයෙන් බැහැර කිරීමට කැෂියස්ට අවශ්‍යව ඇත. එමෙන්ම, දැනටමත් මුදාහැර ඇති පුත්‍රයාද ඔහුගේ සෙසු පුත්‍රයන් සමඟ උරුමයේ පිහිටුවීමටත්, ඔහුගේ අතිශයෙන්ම හිතෛෂී වහලා නිවහල් කිරීමටත් කැෂියස්ට අවශ්‍යව ඇත.

රෝම නීතිය යටතේ අදාළ නෛතික මූලධර්ම සහ හේතු සඳහන් කරමින් ඉහත දක්වා ඇති අවස්ථාවන්හිදී ඔහුගේ නෛතික තත්ත්වය පිළිබඳව කැෂියස්ට උපදෙස් දෙන්න.

**(ලකුණු 20)**

-හිමිකම් ඇවිරිණි-